# 11 පුමිතිරි බවෙහි අභිමානය සුරකිමු



මිනිස් වර්ගයාගේ පැවැත්ම උදෙසා ප්‍රජනක පද්ධතියෙන් ඉටු වන මෙහෙය අසිරිමත් වේ.

නව ජීවියෙක් බිහි කිරීමටත් ජීවියාගේ ආරක්ෂාව උපරිම ලෙස තහවුරු වන අන්දමටත් ප්‍රජනක පද්ධතිය සැකසී ඇති ආකාරය කෙතරම් අපූර්ව ජනකද? නව ජීවියා බිහි කිරීමේ කාර්යයේ දී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම දායකත්වය අත්‍යවශ්‍ය වේ.

ප්‍රජනක කාර්යය වින්දනාත්මක වූත් සුන්දර වූත් යහපත් දෙයක් බවට පත් කිරීම සඳහා නව යෞවන අවධියේ පසුවන ඔබේ ලිංගිකත්වය පිළිබඳ දැනුවත් බව වැදගත් වේ. එසේ නම් ලිංගිකත්වය යනු කුමක්ද යන්න පිළිබඳ ව ඔබ දැනුවත් වන්න.

ලිංගිකත්වය යනු කාන්තා හා පිරිමි ස්වභාවය හා ඒ හා සබැඳි චර්යා, හැසිරීම් ආදිය යි.

**ක්‍රියාකාරකම 11.1**

කාන්තාව සහ පිරිමියකු අතර ඇති වෙනස්කම් දක්වන ගති ලක්ෂණ කිහිපයක් සටහන් කරන්න. ඔබ ලියන ලද වෙනස්කම් පහත දැක්වෙන සටහන සමඟ සසඳා බලා ලිංගිකත්වය පිළිබඳ ඔබේ අදහස තහවුරු කර ගන්න.




11.1 රූපය

කාන්තාවක හා පිරිමියකු අතර පවතින හැඩරුව, හැසිරීම් විලාස, හැකියා, හැඟීම්, අනාගත අපේක්ෂා, අන් අය සමඟ පවත්වන අන්තර් පුද්ගල සබඳතාවල ස්වභාවය යනාදී ගති ලක්ෂණ අනුව ඔවුන් දක්වන විවිධ වෙනස්කම් ප්‍රකාශ කරන ආකාරය මානව ලිංගිකත්වය (human sexuality) ලෙස හැඳින්වේ.

මානව ලිංගිකත්වය පිළිබඳ ව කතා කිරීමේදී පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

## ලිංගික අනන්‍යතාව (Sexual Identity)

ලිංගික අනන්‍යතාව පහත දැක්වෙන පරිදි විමසා බැලිය හැකි ය.



### කායික අනන්‍යතාව

කෙනෙකු උපදින විට දක්නට ලැබෙන බාහිර ලිංගික ඉන්ද්‍රියන්ගේ පිහිටීම අනුව ඔහුට හෝ ඇයට කායික වශයෙන් ස්ත්‍රී හෝ පුරුෂ ලෙස ලිංගික අනන්‍යතාවක් හිමි වේ.

### සමාජයීය අනන්‍යතාව

උපතේ දී ලැබූ කායික අනන්‍යතාව අනුව දෙවනු ව සමාජයීය වශයෙන් ද අනන්‍යතාවක් දෙනු ලැබේ. ඒ අනුව කෙනෙකුට ස්ත්‍රී හෝ පුරුෂ වශයෙන් නමක් ලැබේ. නම ඇසූ පමණින්, බොහෝ විට කාන්තාවක් ද පිරිමියෙක් ද කියා අනුමාන කළ හැකි ය.

### මානසික අනන්‍යතාව

තම පවුල, වැඩිහිටියන් සමාජය විසින් ඔබට ඉදිරිපත් කෙරෙන සාරධර්ම, සිරිත් විරිත්, ආකල්ප අනුව තමා කාන්තාවක හෝ පිරිමියකු ලෙස ජීවත් වීමට අවශ්‍ය අභිමානයක්, විශ්වාසයක් ගොඩ නංවා ගැනීම යි.

### ලිංගික නැමියාව

කෙනෙකු විසින් ලබා ගත් ලිංගික අනන්‍යතාව අනුව, සමාජය ඔහුට හෝ ඇයට ලිංගික භූමිකාවක් ලබා දෙනු ඇත. ඒ අනුව බොහෝ විට ඇඳුම්, පැළඳුම්, කතා බහ කරන විලාසය, ඇවිදින විලාසය අංග චලන, කළ යුතු හා නොකළ යුතු දේ හා රැකියාව ආදිය පවා බොහෝ විට ගැහැනු පිරිමි වශයෙන් බෙදු වෙන් වන අවස්ථා ඇත. මෙය ලිංගික නැමියාව ලෙස සරල ව හැඳින්විය හැකි ය.

## ලිංගිකත්වය ඔබට වැදගත් වන්නේ මන් ද?

- ළමා කාලයේ සුන්දර බව රැක ගැනීම
- පියකු හෝ මවක වීමේ භාග්‍යමත් අවස්ථාවට කෙදිනක හෝ මුහුණදීමට සූදනම් වීම.
- එම භූමිකාව උරුම කර ගැනීම සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම.

පහත දැක්වෙන රූප සටහන දෙස අවධානය යොමු කරන්න




ඉහත දැක්වෙන ක්‍රියාකාරකම්වල දී ඔබ කාන්තාවක හෝ පිරිමියකු ලෙස පරිසරය තුළ ඔබේ අනන්‍යතාව පිළිබිඹු කිරීමෙන් සුන්දර ව සහ ශුභවාදී ව ලිංගිකත්වය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා ගැනීම මඟින් ඔබටත් සමාජයටත් යහපතක් ම සිදු වන බව දැන් ඔබට පැහැදිලි ය.

නුසුදුසු චිත්‍රපටි හා පොත් පත්, පත්තර බැලීම. මද්‍යසාර හා මත්ද්‍රව්‍යවලට ගොදුරු වීම, ලිංගික අපචාරවලට යොමු වීම ආදි වැරදි ක්‍රියාවලට යොමු වීම තුළින් ලිංගිකත්වය අයහපත් ලෙස ප්‍රකාශ වීමට ඉඩ ඇත.

## ලිංගිකත්වය අයහපත් ලෙස යොදා ගැනීමේ අවාසි මොනවා ද?

නිසි අවබෝධයකින් හා පාලනයකින් තොර ව ලිංගිකත්වය ප්‍රකාශ කිරීමෙන් ඇති වන අනර්ථකාරී ප්‍රතිඵල බොහෝ ය.

❖ අනවශ්‍ය ගැබ් ගැනීමට ලක් වීම.
❖ සමාජ අවමානයට ලක් වීම.
❖ ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග බෝ වීම. (STI, HIV/AIDS)
❖ ජීවත් වීමට අවශ්‍ය සමාජ/ ආර්ථික පසුබිමක් නොමැති වීම.
❖ ලිංගික අපචාරවලට ලක් වීම ඉන් සමහරකි.

මිනිස් වර්ගයාගේ බෝ වීම සඳහා අවශ්‍ය ප්‍රජනක කාර්යය සඳහා ප්‍රජනක පද්ධතිය අපූර්ව ලෙස සැකසී ඇති අන්දම මීට ඉහත සඳහන් කරන ලදි. මවගේ සිරුර තුළ ඉතා සුරක්ෂිත අන්දමින් හා නිසි පෝෂණය ලබමින් වැඩෙන කලලය අංග සම්පූර්ණ දරුවකු ලෙස ලොවට බිහි වීමේ කාර්යයේ දී හා වර්ධනයේ දී පියාගේ වගකීම ද අතිශය වැදගත් වේ.

## වගකීම් සහිත ලිංගික චර්යා යනු කුමක් ද?

යමෙකුගේ ලිංගික හැසිරීම නිසි වයසේ දී උචිත පරිසරයක නිරෝගී පැවැත්මක් තුළ සිදු වේ නම් එය වගකීමක් සහිත ලිංගික චර්යාවක් ලෙස හැඳින්විය හැකි ය. එමෙන් ම ඒ මගින් ඇති වන සියලු ප්‍රතිඵල දරා ගැනීමේ වගකීමක් සහ හැකියාවක් ද දෙදෙනාට ම තිබිය යුතු ය.

මෙම කාර්යය හොඳින් සිදු වීම සඳහා සමාජය අනුමත විවාහය වැදගත් ස්ථානයක් ගනී.

නීතිමය පදනමක් මත පවුලක් වශයෙන් කාන්තාවක හා පුරුෂයකු එක් වීම සමාජ අනුමත විවාහය ලෙස හැඳින්වේ. මෙහි දී විවිධ වූ සංස්කෘතිවලට අදළ ව විවිධ චාරිත්‍ර වාරිත්‍ර ද වැදගත් ස්ථානයක් ගනී.



## ස්ත්‍රී පුරුෂ සමාජභාවය (gender) යනු කුමක් ද?

සමාජයීය වශයෙන් ගොඩනංවන ලද ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට පැවරෙන්නා වූ වගකීම්, සමාජමය කාර්ය, භූමිකා හා සමාජය තුළ භුක්ති විඳින අයිතිවාසිකම් යනාදිය ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනුවෙන් හැඳින්වේ. මෙය මානව ගුණාංගයකි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමාජයීය, ආර්ථිකමය, ආගමික, දේශපාලන සහ සංස්කෘතික වශයෙන් තීරණය වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බලපාන කාර්යභාරය මෙන් ම හැසිරීම් රටා සමාජමය හා සංස්කෘතික වශයෙන් ගොඩනැගී ඇත. සමාජය විසින් කුඩා කල සිට මේවා උගන්වනු ලැබේ. නැතහොත් අපි සමාජයෙන් උගනිමු. තව ද පවුල, පාසල, ආගමික ස්ථාන මෙන් ම සංස්කෘතික මතිමතාන්තර, පුරුදු ආදිය මගින් ස්ත්‍රී පුරුෂ හැසිරීම් රටා හා කාර්යභාරය පිළිබඳ උගැන්ම ශක්තිමත් කරනු ලැබේ.

මේ කාර්යභාරය කාලයත් සමඟ විවිධ අවශ්‍යතාවලට අනුව වෙනස් විය හැකි ය. එමෙන් ම විවිධ සංස්කෘති තුළ විවිධාකාරයෙන් දැකිය හැකි ය.

ලිංගිකත්වය හා සබැඳි සියලු සබඳතාවල දී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙහි ම වූ සමානත්වය, අන්‍යෝන්‍ය අවබෝධය සහ වගකීම මෙන් ම එකිනෙකාට ගරු කිරීම වැඩිහිටි කාන්තාවන් සහ පිරිමි මෙන් ම නව යෞවන අවධියේ පසු වන දරු දැරියන් වන ඔබ සැම අතර ද වර්ධනය කරගත යුතු වැදගත් ගුණාංගයකි.

පහත සඳහන් ගුණාංග ඔබ සතු ව ඇත්දැයි සිතා බලන්න.

- ❖ නිවසේ දී සොහොයුරාට, මවට, පියාට සමානත්වයෙන්, නිසි වගකීමකින් යුතු ව සැලකීම.
- ❖ පාසලේ තමාගේ යහළු යෙහෙළියන්ට, සමාන ව සලකමින් සමාන අවස්ථා ලබා දෙමින් ඔවුන් කෙරෙහි ආදරයෙන් හා ගෞරවයෙන් යුතු ව හැසිරීම.

විශේෂයෙන් ගැබිණි අවස්ථාවේ දී කාන්තාව රැක බලා ගැනීම මෙන් ම නවජයාගේ උපතේ සිට ළමා සංරක්ෂණය හෙවත් ළදරුවා රැකබලා ගැනීමේ දී ද පුරුෂයා සතු වගකීම අසීමිත ය.

### ගැබිණි අවස්ථාවේ දී පුරුෂයාගේ වගකීම

1. මවට සහ ඉපදීමට බලාපොරොත්තු වන දරුවාට යෝග්‍ය පරිදි පෝෂණ අවශ්‍යතා සපුරාලීම.
2. ගැබිණි මවගේ මානසික තත්ත්වය යහපත් ව පවත්වා ගැනීම
3. පෝෂණ අවශ්‍යතාවලට අමතර ව ගැබිණි මවගේ වෙනත් අවශ්‍යතා ඉටු කිරීම
   උදා : ව්‍යායාමවල නිරත කරවීම. (ඇවිදීම)
4. මානසික සුවය ලබා දීමට කටයුතු කිරීම.
5. ඇයට ගමන් බිමන් යාමට, මිතුරු මිතුරියන් ඇසුරට අවස්ථාව සලසා දීම වැනි සමාජයීය අවශ්‍යතා ඉටු කිරීම
6. අවශ්‍ය පරිදි ආගමික කටයුතු සඳහා පහසුකම් සලසා දීම.

### ළමා සංරක්ෂණයේ දී පුරුෂයාගේ දායකත්වය

1. භාර්යාව නිවසෙහි වෙනත් වැඩකටයුතුවල නිරත වීමේ දී දරුවා රැක බලා ගැනීම.
2. කාන්තාව සමඟ ගෙදර දොර එදිනෙදා කාර්ය බෙදා හදා ගැනීම.
3. දරුවන් ඇති දැඩි කිරීමට සහාය වීම.
4. යහපත් සමාජ පරිසරයක් ඔවුන්ට ලබා දීම.
5. ළමයාගේ සෞඛ්‍යය පිළිබඳ ව සැලකිලිමත් වීම.

වගකිවයුතු දෙමව්පියන් සේ භාර්යාව සහ පුරුෂයා ක්‍රියාත්මක විය යුතු ය.

නායකත්වය දැරීම, වගකීම් දැරීම, ගෞරවාදරයට පාත්‍ර වීම, කැපී පෙනීම, කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය ඔබ තෘප්තිමත් කරයි. ඔබේ තෘප්තියට හානි සිදු වන අවස්ථා ඇත.

විකෘති මනසකින් යුත් සමාජයේ විවිධ වූ පුද්ගලයන් ඔබ අපයෝජනයට ලක් කළ හැකි ය.

ලිංගික අපයෝජනය යනුවෙන් හැඳින්වෙන්නේ පුද්ගලයාගේ කායික, මානසික, චිත්තවේගික හා සමාජයීය සංවර්ධනයට බාධා කරන කුමන හෝ ලිංගික ක්‍රියාවකට පුද්ගලයා ගොදුරු කර ගැනීම හෝ ඒ සඳහා කුමන හෝ ආකාරයකින් දායක වීම යි.

ළමයින් හෝ යෞවනයන් මේ සඳහා යොදා ගැනීම බලහත්කාරයෙන් හෝ රැවටීමෙන් හෝ සිදුවන්නකි. සමාජයේ විවිධ වූ පුද්ගලයන් අතින් ඕනෑ ම දරුවෙකු හෝ දැරියක හෝ මෙවැනි අපයෝජනයකට ලක් විය හැකි බැවින් සියලු දෙනා පිළිබඳ ව අවධානයකින් සිටීම ඔබේ ආරක්ෂාවට හේතු වේ.

මෙවැනි අපයෝජනයකට ලක් වුවහොත් දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම, සමාජයේ අපකීර්තියට පත් වීම, ලිංගික සම්ප්‍රේෂණ රෝගවලට ගොදුරු වීම ආදි හානිකර තත්ත්ව ඇති විය හැකි බැවින් කල්පනාකාරී ව ජීවත් වීමට වගබලා ගත යුතු ය.

දැන් ඔබ අසීමිත උවමනා හා ඉලක්ක පිහිටුවා ගනිමින් අනාගත ජීවිතයේ ස්ථිරසාර පදනමකට අඩිතාලම දැමීමට සූදානමින් සිටී. එසේ නම් ලිංගිකත්වය පිළිබඳ නිවැරදි අවබෝධයකින් යුතු ව ඔබේ යොවුන් වියේ වගකීම් සහ යුතුකම් හඳුනා ගන්න.

සියල්ලට ම කලින් ඔබ ඔබට ම ගරු කරන්න. ඔබ ව ම අගය කරන්න. අවදානම් තත්ත්ව මගහැර තමන්ගේ වටිනා ජීවිතය ආරක්ෂා කර ගැනීමට අධිෂ්ඨාන කර ගන්න.

- ❖ බල කිරීමකින් හෝ වෙනත් මොනයම් ක්‍රමයකින් හෝ ඔබ අකමැති යමක් කිරීම සඳහා යොමු කෙරෙන අවදානම් ඉඟිය හඳුනා ගන්න.
- ❖ කිසිවකුගේ අනිසි යෝජනාවලට කිසි ම අවස්ථාවක දී නතු නොවන්න. උපක්‍රමශීලී ව එවැනි දේට තරයේ විරුද්ධ වන්න. උපක්‍රමශීලී ව එතැනින් වහා ඉවත් වීමට වග බලා ගන්න.
- ❖ හැඟීම් සහ ආශාවලට නතු නොවී ජීවිතයේ සාර්ථකත්වයට මග පාදා ගන්න.
- ❖ දුම්වැටි භාවිතය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිත යොමු නොකරන්න.
- ❖ අසත්‍ය, අසභ්‍ය ප්‍රචාරවලට හසු නොවන්න.
- ❖ ඔබේ නිවසේ, පාසලේ හා ප්‍රදේශයේ සමාජ සංවර්ධන කටයුතුවල නිරත වන්න.
- ❖ ඔබ සතු ධෛර්ය, ශක්තිය, ජවය ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු වෙත යොමු කරන්න.

එමගින් පාසලේ, පළාතේ සහ මුළු මහත් ශ්‍රී ලංකාවේ යහපතට දායක වීමට ඔබට හැකි වනු ඇත.

- ❖ තමා අපයෝජනයට ලක්විය හැකි අවස්ථා හඳුනා ගන්න. එයින් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය පියවර ගන්න.
  උදා : පාළු පාරවල තනි ව ගමන් නොකිරීම.